17-9417
d 25 04 2005
ශ්‍රී. 5000/-

# හින්දු හා ථෙරවාදී බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත පරමාදර්ශී නායකත්වය

රණසිංහ මුදියන්සේලාගේ
සමන් චන්ද්‍රසේන

GS/HU/01/96

දර්ශනසූරි (Ph.D) 2004 . 04 . 26

177947

LB|DOM|47|2005

CR

CR
294
CHA

177947

**පර්යේෂකයාගේ ප්‍රකාශය**

මෙම පර්යේෂණ නිබන්ධය මහාචාර්ය මහින්ද පලිහවඩන සහ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ යන උපදේශකවරුන්ගේ සුපරීක්ෂණය යටතේ මවිසින් සම්පාදනය කරන ලද්දක් බවත් මෙය හෝ මෙහි කොටසක් හෝ වෙනත් උපාධි අවශ්‍යතාවක් උදෙසා කිසිදු විශ්වවිද්‍යාලයකට ඉදිරිපත් කොට නොමැති බවත් මෙයින් සහතික කර සිටිමි.

.........................................................

පර්යේෂකයාගේ අත්සන

26 APR 2004

## උපදේශකවරුන්ගේ ප්‍රකාශය

මෙම පර්යේෂකයා විසින් කොට ඇති ඉහත ප්‍රකාශය සත්‍ය බවත් ඇගයීම් කටයුතු සඳහා " හින්දු හා ථෙරවාදී බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත පරමාදර්ශී නායකත්වය " නමැති මෙම පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් සහතික කර සිටිමු.

[signature]
1. උපදේශකවරයාගේ අත්සන

[signature]
2. උපදේශකවරයාගේ අත්සන

2004-10-18 දින පැවති වාචික පරීක්ෂණයේදී පරීක්ෂකවරුන් විසින් දක්වන ලද අඩුපාඩු අපේක්ෂකයා විසින් සම්පූර්ණ කරනු ලැබ ඇත. [illegible] ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ කරමි.

[signature]
උපදේශක (1)

2004-10-18 දින පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂකවරුන් විසින් දක්වන ලද අඩුපාඩු අපේක්ෂකයා විසින් සම්පූර්ණ කරනු ලැබ ඇත. මෙම [illegible] ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ කරමි.

[signature]
උපදේශක (2)

2004-11-15

16 NOV 2004

# හින්දු හා ථෙරවාදී බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත පරමාදර්ශී නායකත්වය


රණසිංහ මුදියන්සේලාගේ
සමන් චන්ද්‍රසේන


GS/HU/01/96

සංස්කෘත විෂය යටතේ දර්ශනසූරි (Ph.D) උපාධි පරීක්ෂණය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයට ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධය


භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල,
නුගේගොඩ.


2004.04.26

# පිළිගැන්වීම

විදුර ද දියුණ තිරතුරු හද තුළ රන් ද
සවස ද දිවා නොබලා වෙහෙස ද වින් ද
පැහැන ද ගුණෙන් යුතු මුතුකුඩ මැති හත් ද
ඇමස ද මෙකී විදුහල ජයදද බැන් ද

යුගයෙන් යුගය ඔහු සුවඳින් සුවඳ වෙ වී
විදුරද ඇදේවා පෙරට ම නතර නො වී
ඔහුගේ සුවඳ මල් හා තුරු අතර කැ වී
පවසනු වැන්න මල් යුගයක මිහිරි ක වී

තුරඟ සන්දේශයෙනි, අමුද්‍රිත යි.

වචනය හා එහි අර්ථය සෙයින්
එකිනෙකින් වෙන් කළ නොහෙන,
මට සිප් කිරි පෙවූ
**හෝකන්දර විද්‍යාරාජ මහ විදුහල් මාතාවටත්,**
එහි අපේ යුගයේ ගරු විදුහල්පති,
**සැදැදරණීය ජී. සී. මුතුකුඩ**
**ඇදුරුතුමන්ගේ සදනුස්මරණීය නාමයටත්**
ඉමහත් ගෞරවයෙන් හා අපරිමිත භක්තියෙන්
මේ පර්යේෂණ ග්‍රන්ථය පිළිගන්වමි.

# අනුස්මරණ-ස්මරණ සහ ස්තුතිපූජා

සංස්කෘත භාෂාව වෙතත් උපනිෂද් ආචාර්යවරුන් වෙතත් යොමු කරමින් මෙබඳු කියකට මා සුදුසු කළ කීර්තිශේෂ භාවෝපගත සදදරණීය ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්තුමන්,

මගේ ජීවිතය මෙන් ම අපමණ ජීවිත එළිකොට බැසගිය සඳ-හිරු සදාදරණීය තාත්තා සහ අයියා,

ගුරු ජීවිතයේ අරුත සිය ජීවිතයෙන් ම කියා දුන් නොකල්හි අහිමි ව ගිය දයාබර ආචාර්ය මහානාම කරුණාරත්න ඇදුරුතුමන්,

අතිමහත් ගෞරවයෙන් අනුස්මරණය කොට මෙම පර්යේෂණ ග්‍රන්ථයේ නිමාව තෙක් ලද විවිධ ස්මරණ සමග ස්තුති පූජාව මුදු කරනු කැමැත්තෙමි.

පළමු කොට මට සංස්කෘත භාෂාවේ 'අ' යන්නේ සිට මෙම ආචාර්යෝපාධිය දක්වා උගන්වමින් ළබැඳි ගුරු පියකු සෙයින් ද වැඩිහිටි කලණ මිතුරකු ලෙසින් ද සමීප වන මෙහි උපදේශකවරයකු ද වන සංස්කෘත පිළිබඳ හිටපු මහාචාර්ය දයාබර මහින්ද පලිහවඩන ඇදුරුතුමන් සහ

දුබල වන සිත හැදින දිරිමත් කරමින් ද හෘදයංගම වෙමින් ද පර්යේෂණ කාර්යයක ඇති ගැඹුර පහදා දෙමින් ද මට මග පෙන්වූ මෙහි උපදේශකවරයකු ද වන සංස්කෘත පිළිබඳ හිටපු මහාචාර්ය දයාබර වෝල්ටර් මාරසිංහ ඇදුරුතුමන් ද ගෞරවාදරයෙන් සිහිපත් කරමි.

එසේ ම පාසල් ජීවිතයේ පළමු වසරේ සිට සරසවි ජීවිතය දක්වා වන මගේ අධ්‍යාපන චාරිකාවේ විවිධ වකවානුවල දී මට ඉගැන්වූ සියලු ම ගුරු පියවරුනට- ගුරු මෑණිවරුනට බැති හදින් සිරස නමමි. එසේ ම උඩහමුල්ලේ ශ්‍රී රේවත, හෝකන්දර විද්‍යාරාජ සහ කොට්ටාව ආනන්ද යන මගේ පාසල් මාතාවනටත් ශ්‍රී ජයවර්ධනපුර-විද්‍යෝදය සරසවි මාතාවනටත් බැතිකුසුම් පුද කිරීමට ද මෙය අවස්ථාව කොට ගනිමි.

කැලණිය විශ්වවිද්‍යාලයේ යක්කල වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමියනට මෙය තමාගේ ම කටයුත්තක් විය. මෙහි ප්‍රධාන මූලාශ්‍රය ද්වය වන රාමායණයත් ජාතකට්ඨකථා පොත් පෙළත් මට තිළිණ කරමින් ද මෙම අධ්‍යයනය ගැන නිරන්තරයෙන් විමසමින් ද විවිධාකාරයෙන් සහාය දෙමින් ද ජීවිතයේ බේදවාචකවලදී ළඟ රැඳෙමින් ද මට උන්වහන්සේ ශක්තියක් වූ ආකාරය අමතක කළ නොහේ.

උන්වහන්සේ සේ ම මට සමීප වූ කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මුවඇටගම ඤාණානන්ද හිමි, පූජ්‍ය අයගම සුසීල හිමි, පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි, පූජ්‍ය මීපිටියේ සීලරතන හිමි, පූජ්‍ය කටුවන චන්දරතන හිමි, පූජ්‍ය මාහංගල සුමනානන්ද

හිමි සහ පූජ්‍ය තලගල සිරිනිවාස හිමියන් ඇතුළු මෙහි නම් සඳහන්, නොසඳහන් සියලු ස්වාමීන් වහන්සේලාට මගේ ගෞරවයත් ආදරයත් පුද කොට සිටිමි.

මෙම පර්යේෂණ කාර්යයේ දී විවිධාකාරයෙන් මට සහාය දුන් විද්වත් පර්ෂදය වෙත ගරුබුහුමනින් යුතු ව ස්තුති පූජාව පළකිරීමට ද මෙය අවස්ථාව කොට ගනිමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපති මෙන් ම ශාස්ත්‍රපීඨාධිපති සහ මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සභාපති ද වන මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහාත්මා, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ප්‍රථම පීඨාධිපති මහාචාර්ය එම්. කරුණානායක මහාත්මා, හිටපු පීඨාධිපති මහාචාර්ය ඩී. එන්. තන්තිරිගොඩ මහාත්මා, වර්තමාන පීඨාධිපතිනි මහාචාර්ය කුමුදු විජේවර්ධන මහාත්මිය, මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලයේ හිටපු සභාපති මහාචාර්ය තිස්ස කාරියවසම් මහාත්මා, හිටපු ශාස්ත්‍ර පීඨාධිපති මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහාත්මා, භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ හිටපු අංශ ප්‍රධාන මහාචාර්ය ආනන්ද ගුණසිංහ මහාත්මා, එම අධ්‍යයනාංශයේ වත්මන් අංශ ප්‍රධාන ආචාර්ය බණ්ඩාර මැණිකේ විජේතුංග මහාත්මිය,

හිටපු උපකුලපතිවරුන් වන මහාචාර්ය ජගත් වික්‍රමසිංහ මහාත්මා හා ආචාර්ය දේ. සෙනෙවි එපිටවත්ත මහාත්මා, මහාචාර්ය සුනිල් ආරියරත්න මහාත්මා, මහාචාර්ය ආරියපාල පෙරේරා මහාත්මා, මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා මහාත්මා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එඩ්වින් ගණිහිගම මහාත්මා, ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න මහාත්මා, ආචාර්ය බි. එම්. පී. සිංහකුමාර මහාත්මා ඇතුළු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලීය ගුරුභවත්හු ඒ අතර වෙති.

මගේ ගුරු පියවරුන් වන මහාචාර්ය රත්න විජේතුංග, ආචාර්ය ගැමුණුසිරි ගමගේ, ආචාර්ය රෝලන්ඩ් අබේපාල ඇදුරුතුමන්ලා සහ අනුලා විජේරත්න මැණිකේ ඇදුරුතුමියත් බැති සිතින් සිහිපත් කරමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති පී. විදානපතිරණ මහාත්මා, සහකාර පුස්තකාලයාධිපති පුංචිබණ්ඩා ගල්ලබ, එච්. පී.එස්. නිශ්ශංක මහාත්මා ඇතුළු පුස්තකාලීය කාර්ය මණ්ඩලයේ හිතවතුනට මෙන් ම පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සහකාර ලේඛකාධිකාරී ධම්මිකා චන්ද්‍රතිලක මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයට ද බෙහෙවින් කෘතඥ වෙමි. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිතුමන් ඇතුළු එහි කාර්ය මණ්ඩලය වෙතින් ලද සහාය ද වෙසෙසින් අගයමි. එසේ ම කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයේ සහෘද ස්වාමීන් වහන්සේලාට සහ ගිහි ආචාර්ය භවතුනට ස්තුතිය පළ කිරීමටත් මෙය අවස්ථාව කොට ගනිමි.

මේ පර්යේෂණ කාර්යයේ දී මතු නො ව ජීවිතයේ ඇතිවන විවිධ කටයුතුවල දී සිය සහෘදභාවය ම පළ කරන සහෘදයෝ ද රැසක් වෙති. ඒ අනුව පණ්ඩිත කිවිපති

විමල් අභයසුන්දර මැතිතුමා, ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර, ආචාර්ය ජයන්ත ජයසිරි, අනිල් අබේගුණවර්ධන, චන්දික වේරගල, මනෝජ් පෙරේරා, පද්මසිරි වීරවර්ධන, විජේසිරි අරඹගේ, ධර්මවර්ධන දිසානායක, දිනසිරි දිසානායක ඇතුළු සියලු සහෘදයන්ගේ හද පුදසුන් මත කල්‍යාණ මිත්‍රත්වයේ කුසුම් පූජා කරමි.

ශාරීරික මෙන් ම මානසික සුවය ද සලසන වෛද්‍ය චන්ද්‍රසිරි වැලිවිට, වෛද්‍ය සනත් හෙට්ටිගේ සහ වෛද්‍ය විමලචන්ද්‍ර සිරිසේන යන පෙර,පර දෙදිග ජීවක උතුමනි, ඔබගේ ආදරණීය ජීවිත ගැන සිහිපත් කිරීමත් මට සතුටකි, ශක්තියකි.

චානක අමරතුංග, රත්නප්‍රිය විජේරත්න, තුෂාර යශෝද් මාරගල, ජසින්ත ජයසංඛ දික්කුඹුර, රසික කරුණාරත්න, සමන් රූපසිංහ, ජානක කමල්ගොඩ, සංජීව ජයවර්ධන, නිශාන්තලාල් කෝණාර, සම්පත්, චින්තක, නිරෝෂන්, මධුවන්ති රුබසිංහ, රසිකා හඳපාන්ගොඩ ඇතුළු තරුණ සහෘද පර්ෂදයෙන් ද සැලසුණේ ඉමහත් සේවයකි. ඒ සැමට පින් දෙමි. දයාරත්න තිසේරා, ගාමිණී රුබසිංහ, දිනලි කෞසලී, මංජුලා වීරසිංහ, චන්ද්‍රානි ලංකාමුල්ල, දමයන්ති රත්නායක ඇතුළු සොවුරු සොවුරියෝ ද ඉතා ආදරයෙන් සිහිපත් කරමි.

මට විවිධාකාරයෙන් සහාය දුන්, දෙන විද්‍යුදය අතීත-වර්තමාන ශිෂ්‍ය ප්‍රජාවට සහ අයියාගේ සදාදරණීය ජීවිතයට ආදරය කළ ඔහුගේ සිසුන් හා මිත්‍ර ප්‍රජාව වෙතින් පළවන හිතමිතුරුකම් ද අගයමි.

හඳුනා ගත් දවසේ පටන් හිත මිතුරුකම් නොමඳ ව පළ කරන උදය කුලතිලක සහෘදයා, කුලතිලක මැතිණිය සහ උදාර පුතා ඇතුළු උදය ග්‍රැෆික්ස්හි කාර්ය මණ්ඩලයට බෙහෙවින් කෘතඥ වෙමි.

ඉමහත් සෙනෙහසකින් අපගේ දියුණුව ම ප්‍රාර්ථනා කරන දයාබර රාමසිරි පලිහවඩන - සීතා ලක්ෂ්මී පලිහවඩන සහෘද යුවල ගෞරවයෙන් සිහි කරමි. හමුවූ මුල් දිනයේ පටන් සුහද බව පළ කරන ඩී. ආර්. පණ්ඩිතකෝරාළ මහාත්මා, නන්දා පණ්ඩිතකෝරාළ මැතිණිය, චමිල්-අනුෂ්කා යුවළ මෙන් ම ජයන්ත-ප්‍රසාදී යුවල ද ආදරයෙන් සිහිපත් කරමි.

ගෘහ කටයුතුවල යෙදෙමින් අපමණ සේවයක් ඉටු කළ දයාබර ලීලා නැන්දා, ලතක්කා මෙන් ම රන්ජනී සොහොවුරියටත් තුති කුසුම් පුදමි.

දයාබර තිස්ස අම්මා, මාමලා, පුංචි අම්මලා මෙන් ම හෝකන්දර, තිස්ස ඇතුළු විවිධ ප්‍රදේශවල විසිරී සිටින ඥාති සහෝදර සහෝදරියන් ආදි කොට ඇති සියලු බන්ධු ජනයන් වෙතින් සැලසුණු ඉතහිතකම් ද අගයමි.

මට මහත් ශක්තියක් මෙන් ම ආලෝකයක් ද වෙමින් ළඟ සිටින සදාදරණීය අම්මාගේ ආශිර්වාදය ද නොමඳ ව ලැබෙන බව මම දනිමි.

සැපෙහි දී නො ව දුකෙහි දී ළඟ රැඳෙන දයාලු බිරිඳ කුසුම් බර ඉසිලුවේ මේ කටයුතුවල දී පමණක් නොවේ. බිරිඳ ලෙස මෙන් ම පර්යේෂණ සහායිකාවක ලෙසින් ද ඇගෙන් සැලසෙන්නේ අපරිමිත මෙහෙයකි.

සදාදරණීය දූ කුසුම් වර්ෂා ද මට ඉටු කොට දෙන්නේ සිය වයසට වඩා වැඩි මෙහෙයකි. ඇයට හිමි කොට දිය යුතු කාලයත් පර්යේෂණ කාර්යය සඳහා අප පැහැර ගන්නා විට එය දරාගෙන නිහඬ ව පොතක් කියවන දියණිය ඔබට ද පින්.

කෘතෝපකාර ස්මරණයේදී බොහෝ සහෘද හිතවතුන්ගේ නම් මෙහි සඳහන් නොවීමට පුළුවන. එහෙයින් නම් සඳහන්-නොසඳහන් සියලු හිත මිතුරනට කෘතවේදීත්වය පළ කරමින් මෙම ස්තුති පූජාව අවසන් කරමි.

## පටුන


**පිළිගැන්වීම**

**අනුස්මරණ, ස්මරණ, හා ස්තුතිපූජා**

**පටුන** I-VII

**සංක්ෂේපය** VIII

**හැඳින්වීම** 1-35

**ප්‍රථම පරිච්ඡේදය** 36-96

**රාමායණය, ජාතකට්ඨකථාව සහ පරමාදර්ශී නායකත්වය**

1.1 රාමායණය හා ජාතකට්ඨකථාව 36-37

1.2 රාමායණය සංස්කෘත සාහිත්‍යය තුළ දරන ස්ථානය 37-38

1.3 රාමායණයේ සැකැස්ම 38-51

1.3.1 කාණ්ඩ II-VI අයෝධ්‍යා-යුද්ධ

1.3.2 I බාල කාණ්ඩය සහ VII උත්තර කාණ්ඩය

1.4 රාමායණයේ කර්තෘත්වය සහ කාල නිර්ණය 51-67

1.5 ජාතකට්ඨකථාව බෞද්ධ සාහිත්‍යය තුළ දරන ස්ථානය 67-69

1.6 ජාතකට්ඨකථාවේ සැකැස්ම 70-79

1.7 ජාතකට්ඨකථාවේ කර්තෘත්වය සහ කාලනිර්ණය 79-87

1.8 කෘති දෙකෙහි නිරූපිත නායකයන් සහ පරමාදර්ශී නායකත්වය 87-93

රාම පෙළපත 93

රාවණ පෙළපත 94-95

බෝධිසත්ත්ව චරිතයේ විකාශය 96

**ද්විතීය පරිච්ඡේදය** 97-150

**2.1 අවතාර සංකල්පය සහ රාම** 97 -123

2.1.1 කෘෂ්ණාවතාරය

2.1.2 රාමාවතාරය

**2.2 බෝධිසත්ත්ව සංකල්පය** 123-150

2.2.1 බෝධිසත්ත්ව සංකල්පය සහ අවතාර සංකල්පය

2.2.1 බෝධිසත්ත්ව යානය හා පාරමිතා සංකල්පය

**තෘතීය පරිච්ඡේදය** 151-220

**3.1 රාම චරිතයේ විශේෂතා** 151-183

3.1.1 රාම ධර්මාත්මන් ලෙස

3.1.2 රාම ප්‍රඥාවන්තයකු ලෙස

3.1.3 රාම වීරවරයකු ලෙස

3.1.4 රාම ශෝක වන්නකු ලෙස

3.1.5 රාම පරිසර හිතකාමියකු ලෙස

3.1.6 රාම කිපෙනසුලු පුද්ගලයකු ලෙස

3.1.7 රාම සහෝදර ප්‍රේමය ඇත්තකු ලෙස

3.1.8 රාම කරුණා ගුණය ඇත්තකු ලෙස

3.1.9 රාම නොකිලිටි ක්‍රියා කරන්නකු ලෙස

3.1.10 රාම කල්‍යාණ මිත්‍රයකු ලෙස

3.1.11 රාම කඩවසම් මෙන් ම ශක්තිමත් පුරුෂයකු ලෙස

3.1.12 රාම චරිත සමාලෝචනය

3.2 බෝධිසත්ත්ව චරිතයේ විශේෂතා 183-220

3.2.1 බෝධිසත්ත්ව දාන පාරමිතාව පුරන්නකු ලෙස

3.2.2 බෝධිසත්ත්ව කාරුණික තැනැත්තකු ලෙස

3.2.3 බෝධිසත්ත්ව ප්‍රඥාවන්තයකු ලෙස

3.2.4 බෝධිසත්ත්ව සීලවන්තයකු ලෙස

3.2.5 බෝධිසත්ත්ව වීර්යවන්තයකු ලෙස

3.2.6 බෝධිසත්ත්ව ධර්මය ආත්ම කොට ඇත්තකු ලෙස

3.2.7 බෝධිසත්ත්ව, ගැහැණිය පිළිබඳ විවිධ ආකල්ප දරන්නකු ලෙස

3.2.8 බෝධිසත්ත්ව ශෝකයත් විශෝකයත් අතර දෝලනය වන චරිතයක් ලෙස

3.2.9 බෝධිසත්ත්ව පරිසර හිතකාමියකු ලෙස

3.2.10 බෝධිසත්ත්ව අප්‍රමාදී චරිතයක් ලෙස

3.2.11 බෝධිසත්ත්ව කල්‍යාණ මිත්‍රයකු ලෙස

3.2.12 බෝධිසත්ත්ව සංකීර්ණ බාහිර ස්වරූප ඇත්තකු ලෙස

**චතුර්ථ පරිච්ඡේදය** **221-288**

**4. රාම, බෝධිසත්ත්ව සහ අහිංසා සංකල්පය පිළිබඳ හින්දු හා බෞද්ධ මත**

4.1 පරිසරය පිළිබඳ රාම ආකල්පය 221-226

4.2 පරිසරය පිළිබඳ බෝධිසත්ත්ව ආකල්පය 226-230

4.3 සත්ත්ව ජීවිත පිළිබඳ රාම ආකල්පය 230-235

4.4 සත්ත්ව ජීවිත කෙරෙහි බෝධිසත්ත්ව ආකල්පය 235-241

4.5 යුද්ධය සහ රාම 241-262

4.6 යුද්ධය සහ බෝධිසත්ත්ව 262-288

**පඤ්චම පරිච්ඡේදය** **289-398**

5.1 රාම සහ හින්දු සමාජය 289-338

5.1.1. රාමායණ සමාජයේ අධ්‍යාපනය සහ ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව 289-296

5.1.1.1 ගුරු ශිෂ්‍ය භූමිකා

5.1.1.2 කාන්තාව සහ අධ්‍යාපනය

5.1.1.3 අධ්‍යාපනය, බ්‍රාහ්මණයා සහ සෘෂි ජීවිතය

5.1.1.4 සමාජ කාර්යයන්හි දී ගුරුවරයාගේ මැදිහත් වීම

5.1.1.5 අධ්‍යාපනය සහ රාම

5.1.2. රාම, රාජ්‍ය පාලකයා සහ පාලන ක්‍රමෝපාය 296-321

5.1.2.1 පාලකයා තුළ තිබිය යුතු ගුණාංග

5.1.2.2 රාජ්‍ය උරුමය

5.1.2.3 අරාජක සමාජය

5.1.2.4 සංග්‍රහ සහ නිග්‍රහ

5.1.2.5 අවිරෝධී පරිසරය

5.1.2.6 බ්‍රාහ්මණ ක්‍රියාකාරිත්වය

5.1.2.7 රාජ්‍ය පාලනයෙහි ලා රජ බිසවුන්ගේ මැදිහත්වීම

5.1.2.8 විවිධ ශිල්පීහු

5.1.2.9 රාවණාගේ බලය තහවුරු කිරීම

5.1.2.10 රාවණාගේ රාජ්‍ය ආරක්ෂක ක්‍රමෝපාය

5.1.2.11 සීතාහරණයෙන් ප්‍රකට වන පාලනෝපක්‍රම

5.1.2.12 විභීෂණගේ චර්යාව

5.1.2.13 සංග්‍රාමයෙහි ලා චතුර්විධ උපක්‍රම

5.1.2.14 සේනා සංවිධානය

5.1.2.15 ප්‍රබල චරිත පහදවා ගැනීම

5.1.2.16 සතුරා හඳුනාගැනීම

5.1.2.17 වරපුරුෂ සේවය

5.1.2.18 රාමගේ වාසස්ථාන පිළිබඳ ආරක්ෂා විධි

5.1.2.19 විවිධ ක්‍රමෝපාය

5.1.3 ආගමික විශ්වාස 321-338

5.1.3.1 විෂ්ණුපූජා

5.1.3.2 අග්නිපූජා

5.1.3.3 ශක්‍ර හෙවත් ඉන්ද්‍ර

5.1.3.4 මහාබ්‍රහ්ම, ඊශ්වර සහ විවිධ දෙවිවරු

5.1.3.5 ගංගා ඇදහීම

5.1.3.6 ශාපය සහ පාපය

5.1.3.7 මළවුන් ඇදහීම

5.1.3.8 නිරය, ස්වර්ගය හා විමුක්තිය

5.1.3.9 විවිධ ආගමික ක්‍රියාකාරකම් සහ විශ්වාස

5.1.3.9.1 සත්‍යය

5.1.3.9.2 ගුරුපූජා

5.1.3.9.3 කාම නගරය

5.1.3.9.4 උපවාසය

5.1.3.9.5 දෛවය පිළිබඳ විශ්වාසය

5.1.3.10 රාම පූජා

**5.2 බෝධිසත්ත්ව සහ බෞද්ධ සමාජය** 339-398

**5.2.1 ජාතකට්ඨකථාවෙන් හෙළිවන තත්කාලීන සමාජයේ අධ්‍යාපනය සහ ගුරු ශිෂ්‍ය චර්යා** 339-355

5.2.1.1 තක්සිලා අධ්‍යාපනය

5.2.1.2 දිසාපාමොක්

5.2.1.3 ශිෂ්‍යචර්යා

5.2.1.4 බෝධිසත්ත්ව සහ ගුරු-ශිෂ්‍ය සබඳතා

5.2.1.5 විවිධ විෂය

5.2.1.6 ජාතකට්ඨකථා සමාජයේ අධ්‍යාපන විශේෂතා

**5.2.2 බෝධිසත්ත්ව, රාජ්‍ය පාලකයා සහ රාජ්‍ය පාලන ක්‍රමෝපාය** 355-372

5.2.2.1 පාලක සුදුසුකම් හා ජාතකට්ඨකථාවෙන් හෙළිවන පාලකයන්ගේ ගතිලක්ෂණ

5.2.2.2 දශරාජ ධර්මය සහ ධාර්මික පාලනය

5.2.2.3 වෙනත් පාලන ක්‍රමෝපාය

5.2.2.3.1 වීථි සංචාරය

5.2.2.3.2 විවාහය

5.2.2.4 මහාඋම්මග්ග ජාතකයෙන් හෙළිවන පාලන ක්‍රමෝපාය

5.2.2.4.1 සතුරු බලවේගවලින් ආරක්ෂාවීම

5.2.2.4.2 උපායෙන් රාජ්‍ය දිනා ගැනීම

5.2.2.4.3 ධර්ම යුද්ධය

5.2.2.5 මහාවෙස්සන්තර ජාතකයෙන් හෙළිවන පාලන ක්‍රමෝපාය

5.2.2.6 රාජ්‍ය උපදේශකයන්ගේ චර්යා

5.2.2.7 බෝධිසත්ත්ව, බෞද්ධ ජීවිතය සහ රාජ්‍ය පාලනය

**5.2.3 ආගමික විශ්වාස** 373-398

5.2.3.1 පූජ්‍යස්ථාන

5.2.3.2 පර්ණශාලා

5.2.3.3 වෘක්ෂ දේවතා සංකල්පය

5.2.3.4 දානය

5.2.3.5 උපෝසථ කම්ම

5.2.3.6 ශීලය, පංචශීලය හා නිරය පිළිබඳ විශ්වාස

5.2.3.7 මෙලොව-පරලොව පිළිබඳ විශ්වාසය

5.2.3.8 පාපය

5.2.3.9 ආගමික ජීවිතය හා ගැහැණිය

5.2.3.9.1 පසේ බුදුවරු

5.2.3.9.2 මව්පිය උපස්ථානය

5.2.3.9.3 ආකාශස්ථ, සමුද්‍ර දේව සංකල්ප

5.2.3.9.4 යාගය

5.2.3.10 තත්කාලීන ආගමික සමාජයේ ස්වභාව

**ෂෂ්ඨ පරිච්ඡේදය** **399-468**

**6. රාම, බෝධිසත්ත්ව සහ ලෞකික පරමාර්ථ සාධනය** 399-424

**6.1 රාමගේ ලෞකික පරමාර්ථ සාධනය** 399-403

6.1.1 හින්දු විවාහ ක්‍රම සහ රාමගේ විවාහය

6.1.1.1 ස්වයංවර විවාහය

6.1.1.2 රාමගේ විවාහය

6.1.2 හින්දු පුරුෂාර්ථ සහ රාම සීතා යුග ජීවිතය 403-421

6.1.2.1 රාම සහ පුරුෂාර්ථ

6.1.2.2 රාම-සීතා යුග දිවිය

6.1.3 රාම ස්වාමි පුරුෂයකු ලෙස 421-424

**6.2 බෝධිසත්ත්ව හා ලෞකික පරමාර්ථ සාධනය** 424-468

**6.2.1 ජාතකට්ඨකථාවෙන් හෙළිවන විවාහ ක්‍රම හා බෝධිසත්ත්ව** 424-439

6.2.1.1 ජාතකට්ඨකථාවේ එන ගාන්ධර්ව - ස්වයංවර විවාහ

6.2.1.2 ජාතකට්ඨකථාවේ එන සමකුල විවාහ

6.2.1.3 ඥාති - මිත්‍ර විවාහ

6.2.1.4 ශීලය මිනුම් දණ්ඩ ලෙස ගෙන කළ විවාහ

6.2.1.5 ප්‍රඥාව මිනුම් දණ්ඩ ලෙස ගෙන කළ විවාහ

6.2.1.6 උපක්‍රමයෙන් සිදුකළ විවාහ

6.2.1.7 රාක්ෂස විවාහ

6.2.1.8 ජාතකට්ඨකථාවේ එන විවිධ විවාහ

6.2.1.9 අලෞකික ජීවිතයේ වෛවාහික ප්‍රවණතා

6.2.1.10 විවාහ ජීවිතයේ අලෞකික ප්‍රවණතා

**6.2.2 ලෞකික පරමාර්ථ සාධනය සහ බෝධිසත්ත්වගේ යුග ජීවිතය** 439-459

6.2.2.1 ගෘහ ජීවිතයෙන් පැවිදි ජීවිතයට යන බෝධිසත්ත්ව

6.2.2.2 පැවිදි ජීවිතයෙන් ගෘහ ජීවිතයට

6.2.2.3 බෝධිසත්ත්ව සහ සඳ භාර්යාවෝ

6.2.2.4 බිරිඳගේ ආදරය නොලද බෝධිසත්ත්ව

6.2.2.5 ලෞකික ජීවිතය තුළ බෝධිසත්ත්වගේ අසත්චර්යා

6.2.2.6 බෝධිසත්ත්වගේ යුග ජීවිත වාර්තා ස්වරූපයෙන් කියැවෙන අවස්ථා

6.2.2.7 ලෞකික ජීවිතය පිළිබඳ බෝධිසත්ත්වගේ උපදේශක භූමිකාව

**6.2.3 බෝධිසත්ත්ව ස්වාමි පුරුෂයකු ලෙස** 459-468

**සප්තම පරිච්ඡේදය** **469-562**

**7. රාම, බෝධිසත්ත්ව සහ අලෞකික පරමාර්ථ සාධනය**

**7.1 රාම සහ අලෞකික පරමාර්ථ සාධනය** 469-510

7.1.1 වර්ණාශ්‍රම ධර්ම, පුරුෂාර්ථ සහ රාමගේ අලෞකික ජීවිතය 469-474

7.1.1.1 රාමගේ වනවාසය හා පුරුෂාර්ථ

7.1.1.2 රාමගේ වනවාසී තාපස ජීවිතය

7.1.1.3 වරදානය පිළිබඳ ලක්ෂ්මණ ආකල්පය

7.1.1.4 වනවාසයෙහි ලා රාම-සීතාගේ ආකල්පය

7.1.1.5 රාම, සීතා හා ලක්ෂ්මණගේ තාපස ජීවිත ප්‍රවේශය

**7.1.2 රාමගේ අලෞකික ජීවිතයෙහි විශේෂතා** 474-490

7.1.2.1 ආහාරය පිළිබඳ රාම දර්ශනය

7.1.2.2 රාමගේ තපස්චරණය පෝෂණයෙහිලා ලක්ෂ්මණගේ දායකත්වය

7.1.2.3 අභිනිෂ්ක්‍රමණය

7.1.2.4 රාමගේ තපස්චරණය හා සීතාගේ භූමිකාව

7.1.2.5 රාම සහ තවුසෝ

7.1.2.6 රාමගේ තාපස ජීවිතය, රණකාමිත්වය සහ ප්‍රචණ්ඩ වේශය

7.1.2.7 රාම, භරත සහ තවුස් ජීවිතය

7.1.2.8 ලෞකික භාව සහ රාම

7.1.2.9 රාම පිළිබඳ ව නායක තවුසන්ගේ ආකල්පය

7.1.2.10 රකුසන්ගේ තවුස් ජීවිතය

7.1.2.11 රාම සහ සීතා

7.1.2.12 රාමගේ මනුෂ්‍යත්වය සහ දේවත්වය

7.1.2.13 රාමගේ අලෞකික ජීවිතයේ සංකීර්ණත්වය

**7.1.3 රාම සහ විමුක්තිය** 490-510

7.1.3.1 විමුක්තිධරයාගේ ස්වභාවය පිළිබඳ බෞද්ධ-හින්දු ආකල්ප

7.1.3.2 රාම හා විමුක්තිලාභියා

7.1.3.3 රාම හා ඔහුගේ විමුක්තිය පිළිබඳ ව රාම පාක්ෂික චරිතවල ආකල්පය

7.1.3.4 විමුක්තිය සහ රාම

**7.2 බෝධිසත්ත්ව සහ අලෞකික පරමාර්ථ සාධනය** 510-562

**7.2.1 ජාතකට්ඨකථා තුළ ප්‍රකට කැරෙන බෝධිසත්ත්වගේ අලෞකික ජීවිතයේ විවිධාවස්ථා** 510-530

7.2.1.1 බෝධිසත්ත්වගේ තවුස් භූමිකා

7.2.1.2 අලෞකික ජීවිතයට පිළිපන් ක්ෂත්‍රියයෝ

7.2.1.3 බෝධිසත්ත්වගේ දිව්‍යමය ජන්ම

7.2.2.4 ගිහිජීවිතය තුළ අලෞකික චරණය

7.2.2.5 පණ්ඩිත පුරිස ලෙස නිරූපිත බෝධිසත්ත්වගේ අලෞකික චරණය

7.2.2.6 සත්ත්ව ජීවිත ආශ්‍රයෙන් අලෞකික ජීවිත විවරණය

**7.2.2 බෝධිසත්ත්වගේ අලෞකික ජීවිතයෙහි විශේෂතා** **530-545**

7.2.2.1 රජකම හැර වනවාසී ජීවිතය වෙත ගිය ක්‍ෂත්‍රිය බෝධිසත්ත්වවරු

7.2.2.2 මෛත්‍රිය සහ ඉවසීම ප්‍රධාන කොටගත් බෝධිසත්ත්වවරු

7.2.2.3 සමීප මරණ අත්දැකීමෙන් පසු පැවිදි වූ බෝධිසත්ත්වවරු

7.2.2.4 විශෝකී බෝධිසත්ත්වවරු

7.2.2.5 කාමයෙහි ආදීනව සහ පැවිදි ජීවිතයෙහි ආනිසංස දුටු බෝධිසත්ත්වවරු

7.2.2.6 විවිධ හේතු නිසා පැවිදි වූ බෝධිසත්ත්වවරු

**7.2.3 බෝධිසත්ත්ව සහ විමුක්තිය** **545-562**

7.2.3.1 භෞතික විමුක්තිය, ආධ්‍යාත්මික විමුක්තිය සහ බෝධිසත්ත්ව

7.2.3.2 බෝධිසත්ත්වගේ විමුක්තියේ ස්වභාවය

7.2.3.3 ස්වර්ගපරායණය සහ බ්‍රහ්මලෝකපරායණය

7.2.3.4 බ්‍රහ්මවිහාර භාවනය

7.2.3.5 පුනර්ජන්මය. බ්‍රහ්මලෝක සංකල්පය සහ විමුක්තිය

7.2.3.6 විමුක්තියට බාධාකර ධර්ම

7.2.3.7 දුකින් මිදීම පිළිබඳ බෝධිසත්ත්ව ආකල්පය

7.2.3.8 බෝධිසත්ත්වගේ විමුක්තිය

**අෂ්ටම පරිච්ඡේදය** **563-582**

**8. සමාලෝචනය**

## සංක්ෂේපය

### හින්දු හා ථෙරවාදී බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත පරමාදර්ශී නායකත්වය

### රණසිංහ මුදියන්සේලාගේ සමන් චන්ද්‍රසේන

මෙම නිබන්ධය පරිච්ඡේද අටකින් සමන්විත ය. හින්දු සාහිත්‍ය විමර්ශනයේ දී රාමායණ සංස්කෘත මූලාශ්‍රයත් ථෙරවාදී බෞද්ධ සාහිත්‍ය විග්‍රහයේ දී ජාතකට්ඨකථාත් විශේෂයෙන් අධ්‍යයනය කැරෙයි. තද්ග්‍රන්ථ විමර්ශනය කිරීමෙන් පසු පෙනී ගියේ රාමායණය ආශ්‍රයෙන් රාම චරිතයත් ජාතකට්ඨකථා ආශ්‍රයෙන් බෝධිසත්ත්ව චරිතයත් මුල්කොට ගනිමින් මෙම අධ්‍යයනය කළ යුතු බව ය. පරිච්ඡේද බෙදීමේදීත් සැලකිල්ලට ගන්නා ලද්දේ එම කාරණය යි.

මෙහි මුලින් ම ඇති දීර්ඝ හැඳින්වීමෙහි යථෝක්ත මූලාශ්‍රය ද්වය තෝරාගැනීමෙහි ඇති යෝග්‍යභාවය ගැන සනිදර්ශන ව කරුණු දක්වා අනුගත ක්‍රමවේදය සැකෙවින් සඳහන් කොට ඇත.

ප්‍රථම පරිච්ඡේදයෙහි රාමායණය සහ ජාතකට්ඨකථාව පිළිබඳ හැඳින්වීමක් කොට තත්කෘතීන්හි නිරූපිත පරමාදර්ශී නායක චරිත මතුකොට ඇත. එම පරිච්ඡේදාවසානයේ රාම පෙළපත- රාවණ පෙළපත සහ බෝධිසත්ත්ව චරිතය පිළිබඳ නාමාවලීන් තුනක් දක්වා තිබේ. ද්විතීය පරිච්ඡේදය වෙන් කොට ඇත්තේ අවතාර සංකල්පය ඔස්සේ රාම සහ බෝධිසත්ත්ව යන චරිත ද්වය විමර්ශනය කිරීමට යි.

තෘතීය පරිච්ඡේදයේ දී රාම චරිතයේ විශේෂතාත් බෝධිසත්ත්ව චරිතයේ විශේෂතාත් සනිදර්ශන ව සාකච්ඡාවට ලක් කොට ඇත. රාම, බෝධිසත්ත්ව සහ අහිංසා සංකල්පය පිළිබඳ හින්දු හා බෞද්ධ මත සාකච්ඡාවට ලක් කැරෙන්නේ චතුර්ථ පරිච්ඡේදයෙහි දී ය. පඤ්චම පරිච්ඡේදයෙහි දී රාමායණය ඔස්සේ රාම සහ හින්දු සමාජයත් ජාතකට්ඨකථා ඔස්සේ බෝධිසත්ත්ව සහ බෞද්ධ සමාජයත් හඳුනා ගැනෙයි. මෙම සමාජ දෙකෙහි අධ්‍යාපනය, රාජ්‍යපාලනය සහ ආගමික විශ්වාසවලට මෙහි දී විශේෂ අවධානය යොමු කොට ඇත.

ෂෂ්ඨ පරිච්ඡේදය වෙන් වන්නේ රාම සහ බෝධිසත්ත්ව සිය ලෞකික පරමාර්ථ සාධනය කොට ගත් ආකාරය ගැන සවිස්තර ව කරුණු සාකච්ඡා කිරීමට යි. සප්තම පරිච්ඡේදය යථෝක්ත චරිත ද්වය, සිය අලෞකික පරමාර්ථ සාධනය කොටගත් ආකාරය පැහැදිලි කිරීමට වෙන් කොට ඇත.

අෂ්ටම පරිච්ඡේදය සමාලෝචනය යි. පරිච්ඡේද සතක් පුරා ඉදිරිපත් වූ කරුණු මෙහි දී සමාලෝචනය කැරෙයි. එයිනික්බිති, එළැඹි නිගමන දක්වා ඇත. එයින් පසු ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය දක්වා අවසාන වශයෙන් සූචියක් ද මෙයට ඇතුළත් කොට තිබේ.